ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

# බෞද්ධෝදය



"ධම්මො හවේ රකඛති ධමමචාරි"

71 වර්ෂය - ශ්‍රී බු,ව 2559 2016 ජනවාරි 23 දුරුතු කලාපය

**තිලොවට ගුරු බුදුමෙන් දරුවො හට දෙගුරු**
**මව්පිය ගුණය මෙහෙමයී මුණි දෙසූ අයුරු**

## මව් පිය වරුණ (අංක 01 කොටස)

**''මාතා''** යන පාලි ශබ්දයකි. එහි අර්ථය ''මව'' යනුයි. මගේ පුතා, මගේ පුතා යි මමායනය කරන හෙයින් ද, කවා පොවා සත්කාර කොට දූ පුතුන් හදන වඩන හෙයින්දි, **'මාතා'** යයි කියනු ලැබේ.

**''පීතා''** යනු පියා යන අර්ථයයි.දූ පුතුන් පිළිබඳ යස ඉසුරු දැක ප්‍රීතිවන නිසා ද, ඔවුන් ගුණ සොයා බලා ආරක්ෂා කරන නිසාද ලොව හැම වස්තුවකටම වඩා දරුවන් ප්‍රිය කරන නිසාද, **'පීතා'** හෙවත් පියා නම් වේ.

මව් පියනට **''පුබ්බාචරිය''** යන නමක් ඇත. එනම් පළමුව ලැබෙන ගුරුවරයාය යනුය. කන බොන හැටි, ඉඳින හිටින හැටි, පළමුව කියා දෙන්නේ දෙමව්පියෝය. එහෙයින් ඔවුහු පළමු ගුරුවරයෝය.

ගෙයි මිතුරා කවරෙක් දැයි ඇසූ පැනයට **''මාතා මිත්ත සකෙ සරෙ''** සිය ගෙයි මිතුරා මව් තොමෝ යයි තථාගතයන් වහන්සේ පිළිතුරු වදාල සේක. මව්පියන් ගෙන් දරුවන්ට පමණ කළ නොහැකි උපකාර ලැබේ. සිය ජීවිතයටත් වඩා ප්‍රේම කරති. මෙසේ හෙයින් ලගම සිටින කලණ මිතුරන් නම් මව්පියන් බව සැලකිය යුතුය

සාමාන්‍ය ගුරුවරු දස දෙනෙකුට වඩා ආගම උගන්වන එක ගුරුවරයකු උතුම්. ආගම උගන්වන සිය දෙනෙකුට වඩා එක කිරි මවක් උතුම්. කිරි මව්වරුන් දහසකට වඩා එක සැමියෙක් උතුම්. සැමියන් දස දහසකට වඩා එක පිය කෙනෙක් උතුම් පියවරුන් ලක්ෂයකටවත් වඩා එක් මවක් උතුම් යනු පුරාණ පත පොතේ පෙනෙන වටිනාම වාක්‍යයකි.

දෙව්ලොවට නැගීමට තිබෙන පහසුම ''හිණි මග'' නම් මෑණියන් වහන්සේ සහ පියාණන් වහන්සේ යයි බුද්ධ ධර්මයෙහි ප්‍රකාශ වේ. මේ ලෝකයෙහි සරු පින්කෙත් සතරක් තිබේ. එනම් බුදුවරයෝය, බුදු සව්වෝය, මෑණියෝය, පියාණෝය, යනුයි. බුදුවරුන් පහල වීම දුර්ලභය. බුදුවරුන් පහල වූ කල්හි ධර්මය ද , සංඝයා ද, පහල වෙති. එහෙයින් තෙරුවන් ලොව පහල වන්නේ කලාතුරකිනි. (එහෙත් මව්පියෝ එසේ නොවෙති.) ඔවුහු වනාහි පහසුවෙන් ලබා ගත හැකිය. යම්තාක් කල් සසර වෙසෙත් ද ඒ තාක් කල් ලැබෙන දෙමව්පියෝ පහසුවෙන් පින් රැස්කර ගත හැකි මහා පින් කෙතකි.

දෙමව්පියෝ මහා බ්‍රහ්මයාට සමාන බැව් ''**බ්‍රහ්මාති මාතා පිතරෝ**'' යනුවෙන් වදාරා තිබේ. සත්ව පූජාව කෙරෙහි මහ බඹුන් තුළ පවත්නා මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා, යන සතර බ්‍රහ්ම විහාර ධර්මයන් තම දූ දරුවන් කෙරෙහි මවුපියන් තුළ ද පවත්නා නිසා දෙමව්පියෝ මහා බ්‍රහ්මයාට සමානය.

මවගේ සිතෙහි ''මෛත්‍රිය'' ඇති වන්නේ දරුවා කුස හෝනා විටදිය. දරුවා පිළිසිඳ ගත් දින සිට මෙලොව එළිය බලන තුරු මා මෙන් මගේ කුස හෝනා දරුවා ද සුවපත් වෙත්වායි මව මෛත්‍රී වඩයි. සිතින් මිණක් නොව ගතින් ද මෙත් වැඩීම වශයෙන් හැම ඉරියව්වක දී පරිස්සම් වෙයි. කොපමණ රසැති ප්‍රිය ආහාරයක් වුවද දරුවාට නොහොබී නම් පිළි නොගනි, නව මසක් හෝ දස මසක් මුළුල්ලෙහි කුස හෝනා සිය දරුවාගේ මුව සිගිත්ත දැකීමේ ආශාවෙන් යෙහෙන් රකියි.

දරුවා ලැබෙන කල විඳිනා දුක කෙබඳු දැයි මව මිස අන් කිසිවෙක නොදනිත්. දරුවා බිහි ඒ මේ අත දුව පනින කාලය වනතෙක් මවගේ සිත තුල දරුවා කෙරෙහි ඇති වන්නේ ''කරුණාව'' මෑණිවරුන්ගේ කරුණාව කොපමණ බලවත් ද යත හොත් රතුපාට ලේ පවා සුදු පාට මිහිරි කිරට හැරේ. කිසිදු යන්ත්‍ර සූත්‍රයකින් කල නොහැකි මේ ආශ්චර්යය මවගේ සිත තුල ඇති වන කරුණා යන්ත්‍රයෙන් ඉබේම සිදුවේ.

රාත්‍රියෙහි කොපමණ වෙහෙසට පත්ව නිදා සිටියද බිලිඳු හඬන කල වහා නැගිට කරුණා හදැති මාතාව සිය දරු වෙත දුව එන්නිය. දරුවාගේ කැත කුණු අත ගාන්නේ පිනිදිය, සඳුන් කල්ක මෙන් සිතාය. දරු වැලඳ ගෙන නලවද්දී ලපටි අතින් ගසන කලද මෙලෙක් පයින් අනින කලද මගේ පුතා! මගේ පුතා! යයි සිප වඩ වඩාත් ආදරය කෙරෙයි.

දරුවා මදක් හැදී වැඩී සමාජය දෙස බලන අවස්ථාව වන විට ඇති වන්නේ ''මුදිතාවයි''

ඉන් පසු දරුවන් තරුණ වියට පා තබා ආවාහ විවාහ ආදියට පත්ව මවුපියන් ගෙන් වෙන් වූ විට මගේ දුව හෝ මගේ පුතා දැන් ඉතින් අප ඇතත් නැතත් කෙසේ මුත් රටේ වෙසෙතියි සිතා ''උපේක්ෂා'' යන සතර වන බ්‍රහ්ම විහාර ගුණය ඇති කර ගනිති.

මෙසේ වූ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා, යන සතර බ්‍රහ්ම විහාරි ධර්මයන් නිසා 'බ්‍රහ්මයයි' නම් ලත් මව්පියන්ට සැලකීම දූ පුතුන්ගේ ශ්‍රේෂ්ඨ යුතුකමකි. ''සුපටිපන්නාදී'' ගාථාවෙහි ''ආහුනෙය්‍ය'' යනුවෙන් සඳහන් සංඝයා කෙරෙහි වූ ගුණ පද තවත් තැනක යොදා ඇත්නම් ඒ යොදා ඇත්නම් ඒ යොදා ඇත්තේ මව්පියන් කෙරෙහිය. වෙහෙස වී ඉතා දුරකතර සිට වුවද ගෙන වුත් දිය යුතු ආහාර පානාදිය පිළිගැනිමට අතිශයින් සුදුසු හෙයින් මවුපියෝ ''ආහුනෙය්‍ය'' නම් වෙති.

චින්තාහා භික්ඛවේ න සුප්පතිකාරං වදාමි මාතුච්ච පිතුච්ච යනු වෙන් මව්පියන්ගේ ලැබුන උපකාරයන්ට සැහෙන ප්‍රත්‍යුපකාරයක් කිරිම දරුවන්ට ඇති දුෂ්කර කාර්‍යයක් බව බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ.

සිය දිවි නොතකා දහසක් දහසක් වෙහෙස දරා දුක් විඳ දරුවන් තැනූ හෙයින් දූ පුතුන් මව්පියන්ට කෙතෙක් ණය ගැතිදැයි කියතොත් අවුරුදු සියයක් ආයු ඇති පුත්‍රයෙක් ඒ අවුරුදු සියය මුළුල්ලේම, ප්‍රත්‍යුපකාර කෙරෙමියි සිතා දකුණු උරහිස උඩ මවත්,වම් උරහිස උඩ පියාත්, සිඳුවා ගෙන ඇඟ ඉලීමය, පිරිමැදිය, නැහැවීමය, අත් පා මිරිකීමය යනාදි වශයෙන් උපස්ථාන කෙරේද එසේ වුවත් මව්පියන්ගේ ලැබූ උපකාරයන්ට ප්‍රත්‍යුපකාර කලා නොවේ.

එපමණකුදු නොව යමෙක් සියලු දඹදිව්තලය බෙර ඇසක් මෙන් සම කොටපිත පමණ සත් රුවනින් පුරා මව්පියන් එහි අධිපති කොට සක්විති රාජ්‍යයෙහි පිහිටු වාද, හේ එසේ කලේ වී නමුදු තම මව්පියනට උපකාර කරන ලද්දේ නොවේ.

මෙසේ මව්පියන්ගේ ගුණ උසස් කොට වදාලේ නිකම් නොව පමණ කල නොහැකි ගුණ ඇති හෙයිනි. මව්පියෝ දරුවන් වඩන්නා හු රුධිරය පෙරා කිරි කොට පොවා අත් පා හදා අන්න පානයෙන් සංග්‍රහ කොට වැඩුහ. යම් හෙයකින් මව්පියෝ දරුවා උපන් දවසේම පාදයෙන් ගෙන ආරණ්‍යයෙහි හෝ නදී ශ්‍රොත්සක හෝ ප්‍රපාතයෙහි හෝ විසි කලාහු නම්, මේ ලෝකය දක්නට සමත් නොවේ. එසේ නොකොට දහසක් කරදර විඳ සිය දිවි නොතකා දරුවෝ තනති. දරුවන් හට මව්පියන් තුල පවත්නා දයාව කෙබඳුදැයි සීවලි මහ රහතන් වහන්සේ ගේ මෑණියන් වූ ''සුප්පවාස'' දේවිය ගේ කථාවෙන් පෙනේ.

පෙරකම් බෙලෙන් ඕතොමෝ සත් අවුරුදු සත් මස් දිනක් ගැබිණියකට සිටියේය. ගැබිණි මව තම දරුවා නිසා බෝහෝ දුක් වින්දාය. දුක වැඩිවෙත් වෙත්ම, තෙරුවන් ගුණ සිතා මා කුස හෝනා දරුවාත් මාත් සුවපත් වෙත්වායි මෙත් වඩන්නීය. මෙසේ වූ සුප්පවාස දේවිය දරුවා ලැබීමෙන් පසුසිය නිවසෙහි මහා සඝනට දන් දෙන්නී, බුදුරදුන් වෙත කුඩා දරුවා රැගෙන ගියාය. එවිට බුදුරජාණන් වහන්සේ සුප්පවාසාව අමතා, නැගණිය! මෙපමණ දුක් විඳි ඔබ තව තවත් දරුවන් ලැබීමට කැමති දැයි විචාලහ. ස්වාමිනි! මෙපමණ දුක් විඳ මෙවැනි එක පුතෙකු නොව සත් දෙනෙකු වුවත් ලබනට කැමැත්තෙමියි ඕ තොමෝ පැවසුවාය. මව්වරුන් දරුවන් කෙරෙහි ඇති දයාව කෙතෙක් දැයි මෙයින් හැගේ.

දරුවන් කෙරෙහි මවගේ ප්‍රේමය බලවත් සේ පෙනෙතත් පියෙක් නොමැති නම් ප්‍රේමය දැක්වීමට අවසරයක් නොලැබේ. යම් හෙයකින් පියෙක් නොමැතිව නම් පුතෙක් ලොව ජනිත නොවේ. පියවරුන්ගේ ප්‍රේමය දරුවන් කෙරේ කෙතෙක් බල පාන්නේ දැයි ''අජාසත්'' කුමරාගේ කථාවෙන් ඉතා හොඳින් අවබෝධ වේ.

(දෙවැනි කොටස ලබන මස කලාපයෙන් බලාපොරොත්තු වන්න)